# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/67 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**හක්මණ උමංගල ඕවාගිරි රජ මහා විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''හක්මණ උමංගල ඕවාගිරි රජ මහා විහාර පූජාභූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***හක්මණ උමංගල ඕවාගිරි රජ මහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2012 අගෝස්තු මස 14 වැනි දින අංක MR/HKM/2012/295 දරන අනුරේඛනයේ නිරූපිත දකුණු පළාතේ,මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ,හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,කන්දබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, ගංගොඩගම ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි පහත දැක්වෙන පරිදි මායිම් වූ හෙක්ටයාර් 4.9704 ක් වූ A අක්ෂරය දරණ කැබැල්ලේ දක්වා ඇති මුළු භූමි ප්‍රදේශයඃ-

**A අක්ෂරය දරන කැබැල්ලට මායිම්**

| | | |
|---|---|---|
| උතුරට | : | අ.ග.පි. අංක 507 හි කැබලි අංක 39 සහ අ.ග.පි. අංක 509 හි කැබලි අංක 01; |
| නැගෙනහිරට | : | අ.ග.පි. අංක 509 හි කැබලි අංක 01 සහ 02; |
| දකුණට | : | අ.ග.පි. අංක 509 හි කැබලි අංක 02, අ.ග.පි. අංක 507 හි කැබලි අංක 34,40 සහ 39 D, |
| බස්නාහිරට | : | අ.ග.පි. අංක 507 හි කැබලි අංක 40,39 D, 39A සහ 39. |

09 - 490

1A - G 20165 — 50 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*